**හලාවත නගර සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර**,** එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 30 දිනද, විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ජූලි 25 දිනද සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට හලාවත නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------

**(අ) ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුල මිලදී ගත් රු.200,655 ක් වටිනා ලිබඩු හා සවිකිරීම් සහ රු.308,207 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ප්‍රාග්ධන ගත කළ යුතු වේ. | නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් මෝටර් රථ හා කරත්ත වටිනාකම රු.4,243,684 ක්, අවසන් තොග ශේෂය රු.557,321 ක් හා ණයහිමියෝ රු.658,961 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | මෝටර් රථ හා කරත්ත, අවසන් තොගය සහ ණයහිමි යන වටිනාකම් අඩුවෙන් දක්වා තිබූ වරද නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ඉතුරුම් තැන්පතු රු.493,245 ක ශේෂය සඳහා ලැබිය යුතු පොලී ආදායම ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | ලැබිය යුතු පොලී ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබූ වරද නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iv) | පසුගිය වර්ෂවල මිලදී ගනු ලැබූ රු.237,525 ක් වටිනා ස්ථාවර වත්කම් අයිතම 07 ක් අතැති තොග ලෙස ගිණුම්වල පෙන්වා තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | මෙම වත්කම් තවමත් ගබඩාවේ තිබෙන බැවින් එය නිදහස් කළ පසු අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කරමි. |

**(ආ) නොසැසඳුණු ගිණුම්**

**-----------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගිණුම් විෂයයන් 16 ක උපලේඛනයන්/උපයෝගි පොත් අනුව ශේෂයන් හා මූල්‍ය ප්‍රකාශන අනුව වූ ශේෂයන් අතර නොසැසඳීම් එකතුව රු.51,603,490 ක් විය. | ලේඛන නිවැරදි කර ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතු වේ. | ලේඛන පරීක්ෂාවේදී වර්ෂ ගණනාවක සිට පැවත එන ශේෂ බැවින් 2019 ගිණුම් සැකසීමේදී එය නිවැරදි කිරීමට කටයුතු කරමි. |

**(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-----------------------------------**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එන වටිනාකම රු.8,871,877 ක් වූ පෙර ගෙවුම් සහ වටිනාකම රු.73,940 ක් වූ විවිධ තැන්පතු නිරවුල් කර නොතිබුණි. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ලේඛනවල වසර කිහිපයක පවතින නොසැසඳීම නිසා මේ පිළිබඳව සොයා බලා ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ii) | 2017 වර්ෂය දක්වා කාලයට අයත් රු.18,991,395 ක් වූ ණයහිමි ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | ලේඛනවල වසර කිහිපයක පවතින නොසැසඳීම නිසා මේ පිළිබඳව සොයා බලා ණයහිමි ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

(ඈ) වි ග වි ග

**ණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම**

**-----------------------------------------------------**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එකතු වටිනාකම රු.309,869,100 ක් වූ විෂයයන් 08 කට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අවසාන ගිණුම් සමග උපලේඛන ඉදිරිපත් කළ යුතු වේ. | මෙතෙක් අවසන් ගිණුම සමඟ ස්ථාවර වත්කම් ශේෂය සැදුම්ලත් විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකෙරුණි. හැකි ඉක්මණින් මෙම ශේෂයන්ට අදාළ උපලේඛන ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වමි. |

**1.4 අනුකූල නොවීම්**

**1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ යනාදියට අනුකූල නොවීම -**

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | නගර සහා ආඥා පනත | | | |
| | 170 වගන්තිය | වර්ෂ 01 කට වැඩි කාලයක සිට හිඟව ඇති වරිපනම් බදු හා හිඟ බදු කුලි සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කල යුතු වේ. | වර්ෂයකට වැඩි කාලයකට සිට හිඟව ඇති වරිපනම් දේපළ 1660ක් සඳහා ලේකම්වරයා විසින් ලබා දී ඇති විනිශ්‍රහන බලපත්‍රයට අනුව රතු නිවේදන නිකුත්කර රු.4,840,947 ක මුදලක් උපයාගෙන ඇත. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | 571 වගන්තිය | තැන්පත් ශේෂයෙහි අතුළත්ව තිබූ කල් ඉකුත් වූ තැන්පත් ආදායමට ගැනීමට හෝ අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ii) | 371(2) වගන්තිය | දෙන ලද අත්තිකාරම් කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුවත් පියවා නොතිබුණි. | අත්තිකාරම් කඩිනමින් පියවීමට කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,885,243 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.40,382,877 ක් විය.

## 2.2 මූල්‍ය පාලනය --

--------------------

### 2.2.1 අක්‍රිය බැංකු ගිණුම්

----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අංක 100070323659 දරන ගිණුමේ ශේෂය රු.493,245 ක් වර්ෂ ගණනාවක සිට අක්‍රියවීම හේතුවෙන් 2018 වර්ෂය සඳහා බැංකුව විසින් පොලිය ගණනය කර නොතිබුණි. | පොලිය ගණනය කර ගිණුම්ගත කළ යුතු අතර ගිණුමේ ශේෂය පිළිබඳව සුදුසු පියවර ගත යුතු වේ. | මේ පිළිබඳව සොයා බලා ශේෂ නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |
| (ආ) | මහජන බැංකුවේ පවත්වාගෙන ගොස් ඇති අංක 763 හා 3397 දරන ජංගම ගිණුම් 02 හි ශේෂයන් පිළිවෙලින් රු.1,244 ක හා රු.24,686 ක වටිනාකම් පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | අදාල ගිණුම් ශේෂයන් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කළ යුතු වේ. | මේ පිළිබඳව සොයා බලා ශේෂ නිරවුල් කිරීමට කටයුතු කරන බව දන්වමි. |

## 2.3 ආදායම් පරිපාලනය

----------------------

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

--------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් බිල්කළ ආදායම්, රැස් කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් දිනට 31මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් දිනට 31මුළු හිඟය |
| | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 | රු. '000 |
| වරිපනම් හා බදු | 22,384 | 22,966 | 22,770 | 37,198 | 22,508 | 22,483 | 11,089 | 37,002 |
| කුලී | 16,467 | 16,535 | 12,369 | 34,716 | 42,400 | 36,307 | 14,988 | 30,550 |
| බලපත්‍ර ගාස්තු | 1,000 | 1,244 | 1,235 | 9 | 1,831 | 1,722 | 941 | 781 |
| වෙනත් ආදායම් | 47,031 | 40,225 | 28,656 | 70,674 | 27,317 | 25,536 | 619 | 59,105 |
| ❖ රැ එකතුව ස් | 86,882 | 80,970 | 65,030 | 142,597 | 94,056 | 86,048 | 27,637 | 127,438 |

කළ ආදායම තුල සමාලෝචිත වර්ෂයට බිල් කළ ආදායමෙන් කළ එකතු කිරීම් සහ පසුගිය වර්ෂවල හිඟ ආදායමෙන් කළ එකතු කිරීම් ඇතුළත්ව තිබේ.

**3.2** ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමස්තයක් ලෙස ගත් කළ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය දුර්වල තත්ත්වයක පවතී. සභාව වරිපනම් පරිගණක ගතකර තිබුණද ඊට සමගාමීව ආදායම් ලේඛන සකස් කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානයට පරිගණක පිටපත් ලබා ගැනීමට නොහැකිවීම නිසා වරිපනම් බිල් කිරීම, ලැබීම් හා හිඟ ශේෂයන්ගේ නිවැරදිතාවය තහවුරු නොවුණි. | ලේඛන යාවත්කාලීනව පවත්වා ගත යුතු අතර පරිගණක දත්ත පිටපත් ලබාගැනීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතු වේ. | සමස්ත ආදායමෙන් 49.19% ක් රැස් කර ඇත. හිඟ හිටි වරිපනම් මුදලින් කෝටි 2කට ආසන්න මුදලක් වැල්ල ප්‍රදේශයෙන් අයවිය යුතුව ඇත. එම ප්‍රදේශවල නෛතික කටයුතු කර හිඟ වරිපනම් මුදල් අය කිරීම සඳහා තහනමට ගැනීමට වංචල දේපළ නොමැති අතර නිශ්චල දේපළ සඳහා ඔවුන්ට ඔප්පු අයිතිවාසිකම් ලබා දී නොමැත. එනම් එම කලාපය සුනාමි අවදානම් කලාපයක් වීමයි. ඔප්පු නොමැති නිසා එම ප්‍රදේශවල වරිපනම් එකතු කිරීම ඉතාමත් ගැටළුකාරී තත්ත්වයක් පැන නැගී ඇත. |

**2.3.3**

වරිපනම් හා බදු

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 ජනවාරි 01 දිනට වරිපනම් බදු හිඟය රු.37,002,095 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය තුල බිල් කිරීම් රු.22,966,000 ක් විය. වර්ෂය තුල අය කරගත් මුදල රු.22,770,434ක් විය. සමාලෝචිත වර්ෂය අවසානයේ මුළු හිඟය රු.37,197,660 ක් විය. | හිඟ වරිපනම් බදු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | සුනාමි අවදානම් කලාපයේ හිඟ වරිපනම් හැර ඉතිරි හිඟ වරිපනම් මුදල් අයකර ගැනීමට කටයුතු කරමි. |

**2.3.4** කුලී

--------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය ආරම්භයේදී හිඟ බදු කුලී හා කඩකුලී රු.30,550,274 ක් වූ අතර, වර්ෂය තුල බිල් කිරීම් රු.16,534,675 ක් වූයෙන් අයකර ගත යුතු මුළු මුදල රු.47,084,949 ක් විය. ඉන් සමාලෝචිත වර්ෂයේ රු.12,368,891 ක් පමණක් අය කරගෙන තිබුණි. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම සමාලෝචිත වර්ෂය සඳහා හිඟ කඩකුලී ගෙවීම සඳහා ලිපි මඟින් දැනුවත් කර ඇති අතර දීර්ඝ කාලීනව බදු කුලී ගෙවීම් නොකරන බදුකරුවන් හට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී. |

| | | |
|---|---|---|
| (ආ) 2013 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන කඩ කුලී සංශෝධනයක් ක්‍රියාත්මක කර අයකර ගැනීමට සභාව අපොහොසත් වූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේ කඩ කුලී හිඟය රු.34,716,058 ක් විය. | හිඟ කඩ කුලී කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2013 වර්ෂයේ තක්සේරුව පදනම් කරගෙන කඩකුලී සංශෝධනයක් ක්‍රියාත්මක විය. එම කුලී මුදල් ඉහල අගයක් නිසා ගෙවීමට නොහැකි බවත්, කඩ කාමර තමන් විසින් සාදාගත් ඒවා බවත් ප්‍රකාශ කිරීම නිසා 2019 මාර්තු 11 හා 12 යන දෙදින පුරා හලාවත නගර සභාවේදී කඩහිමියන් හා පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය ප්‍රධානව හමුවක් පැවැත්විය. එහිදී ගත් තීරණය අනුව ක්‍රියාත්මක වී හිඟ කඩකුලී අයකර ගැනීම සඳහා කටයුතු ක්‍රියාත්මක කර ගැනීමට බලාපොරොත්තු වෙමි. |

**2.3.5 මුද්දර ගාස්තු** -

---------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයේ රු.71,590,235 ක ශේෂයක් පැවති නමුත් ලේඛන අනුව 2015 සහ 2016 වර්ෂ සඳහා පිළිවෙලින් රු.11,888,728 ක හා රු.1,256,169 ක ශේෂයක් පැවතුණි. | අයවිය යුතු මුද්දර ගාස්තු කඩිනමින් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | 2016,2017,2018 යන වර්ෂයන් සඳහා මුද්දර ගාස්තු උපලේඛන මෙතෙක් අප වෙත ලැබී නොමැති අතර උපකල්පිත අගයක් මෙම වර්ෂය සඳහා ගිණුම් ගත වී ඇති බව දන්වමි. |

**3. මෙහෙයුම් සමාලෝචනය** -

----------------------------

**3.1 කාර්ය සාධනය**

-----------------

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) අතුරු ව්‍යවස්ථා**

------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 වර්ෂයේ පළාත් සභාවට ඉදිරිපත් කළ අතුරු ව්‍යවස්ථා 03ක් 2018 දෙසැම්බර් 31 දින වන විටත් ගැසට් කර නොතිබූ අතර 2018 වර්ෂයට අදාලව සම්පාදිත අතුරු ව්‍යවස්ථා 04ක් සම්මත කරගෙන නොතිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2015 වර්ෂයේ සම්පාදිත අතුරු ව්‍යවස්ථා විෂයභාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පල නොකිරීම නිසා ක්‍රියාත්මක නොවිය. 2018 වර්ෂයේ සම්පාදිත අතුරු ව්‍යවස්ථාවල නෛතිකතාවය පිළිබඳ කරුණු සොයා බලා පනවා ගැනීමට කටයුතු කරමි. |

**(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී ප්‍රජා සංවර්ධන අංශයේ ඇස්තමේන්තු වටිනාකම රු.865,000 ක් වූ වැඩසටහන් 15 ක් වර්ෂය තුල ඉටුකර නොතිබුණි. | සැලසුමට අනුව අදාල ව්‍යාපෘතීන් කඩිනමින් ඉටු කර ගැනීමට කටයුතු කල යුතු වේ. | ප්‍රජා සංවර්ධන අංශයේ ණයහිමි රු.176,830 ක් වූ වැඩසටහන් 04 ක් 2019 වර්ෂයේ ඉටු කළ අතර වැඩසටහන් 05ක් ඉටු කිරීමට නොහැකි වී ඇති බවත් වැඩසටහන් 04ක් සඳහා අදාළ අනුබද්ධ ආයතන විසින් වියදම් දරා ඇති බව දන්වමි. |
| (ii) | කර්මාන්ත අංශයේ ප්‍රගති වාර්තාව අනුව ඇස්තමේන්තු වටිනාකම රු.2,516,146 ක් වූ කර්මාන්ත 14 ක භෞතික ප්‍රගතිය සියයට 10 ක මට්ටමේ පැවති අතර භෞතික ප්‍රගතිය සියයට 25ත් සියයට 50 ත් අතර පරාසයක තිබෙන කර්මාන්තවල ඇස්තමේන්තු වටිනාකම රු.1,980,500 ක් වී තිබුණි. | අදාල කාල සීමාව තුලදී වැඩ අවසන් කිරීමට කටයුතු කල යුතු වේ. | දැනට කර්මාන්ත 11ක භෞතික ප්‍රගතිය 100 %ක් වන අතර කර්මාන්ත 04 ක සියයට 10 ක ප්‍රගතියක්ද එක් කර්මාන්තයක සියයට 25 ක ප්‍රගතියක්ද ඇති බව දන්වමි. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය** -

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා සීමාව තුල ජනනය වන මුළු කසළ ප්‍රමාණය ටොන් 18ක් පමණ විවෘත ස්ථානයකට බැහැර කිරීමට කටයුතු කරන අතර කොම්පෝස්ට් අංගනයක් නොමැති බැවින් කොම්පෝස්ට් කිරීමේ කටයුතු ආරම්භ කර නොතිබුණි. නගර සීමාව තුල කසළ බැහැර කිරීම සඳහා සේවකයින් 105 දෙනෙකු හා ට්‍රැක්ටර් 10 ක් යොදවා තිබූ අතර වැටුප් හා වාහන නඩත්තු වියදම් වශයෙන් වසරකට රුපියල් මිලියන 48 ක් වැය කිරීමට සිදුව තිබුණි. | සභාව විසින් ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධ විධිමත් වැඩ පිළිවෙලක් ආරම්භ කළ යුතු වේ. | අවස්ථා 05 කදී කොම්පෝස්ට් ව්‍යාපෘතිය ආරම්භ කිරීමට ඉඩම් සොයා ගත්තද මහජන විරෝධය නිසා මෙය අසාර්ථක විය. ඉදිරියේදී වෙනත් ප්‍රදේශයකින් ඉඩමක් සොයා ගැනීමට කටයුතු කරමි. |

(ඇ) තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| එක්සත් ජාතීන්ගේ සංවිධානයේ "තිරසර සංවර්ධන න්‍යාය පත්‍රය 2030" ප්‍රකාරව ළඟා කරගත යුතු අරමුණු හා ඉලක්ක කරා ළඟා කර ගැනීමේ සූදානම පිළිබඳ පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | | |
| (i) සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු 08 ක් සඳහා ඉලක්කයන් හඳුනාගෙන එම අරමුණු හා ඉලක්ක ළඟා කරගැනීමේ ක්‍රියාකාරකම් රාශියක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීමට කටයුතු කල යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ii) සමාලෝචිත වර්ෂය තුල අපේක්ෂිත අරමුණුවලින් 05 ක් ඉටුකර තිබූ අතර එහි ප්‍රගතිය සියයට 50 ත් සියයට 99 ත් අතර විය. | අපේක්ෂිත අරමුණුවලින් 05 ක් ඉටුකර ඇතත් එය සියයට සියයක් දක්වා ප්‍රගතිය අත්කර ගත යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) නගර සභා කාර්යාල පරිශ්‍රය සඳහා 2018 ජනවාරි සහ පෙබරවාරි මාසවල වායු සමීකරණ යන්ත්‍ර 21 ක් සපයා සවිකිරීම වෙනුවෙන් රු.2,951,449 ක් ගෙවා තිබුණද, එම යන්ත්‍ර ක්‍රියා කරවීමට පවතින විදුලි ධාරිතාවය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් භාවිතා කිරීමට නොහැකි වී තිබූ අතර යන්ත්‍රවල වගකීම් කාලයද අවසන් වී තිබුණි. | අවශ්‍යතාවය නොපමාව ඉටු කර ගත හැකි පරිදි කටයුතු කළ යුතු වේ. | නගර සභා පරිශ්‍රයේ සවිකර ඇති වායු සමීකරණ යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට ඇති විදුලි ධාරිතාවය ප්‍රමාණවත් නොවන හෙයින් මේ වන විට ප්‍රමාණවත් විදුලි ධාරිතාවයක් ඇති විදුලි පරිණාමකයක් සවි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සූදානම් කර අවසන්ව ඇත. |
| (ආ) 2018 දෙසැම්බර් මාසයේදී වැඩ විෂයයන් 05 ක් ඉටුකර ගැනීම සඳහා ප්‍රසම්පාදන දැන්වීමක් පුවත්පත්වල පළකර තිබුණද එයින් වැඩ විෂයයන් 03 ක් ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබුණි. | ප්‍රසම්පාදන කාර්යයයේදී සියළු වැඩ විෂයයන් ආවරණය කිරීමට කටයුතු කල යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පොදු ගබඩා තොගයේ ඇතුළත් රු.33,570 ක් වූ තොගය භෞතිකව නොතිබුණි. | ගබඩාවේ නොමැති තොග සම්බන්ධයෙන් සුදුසු පරිදි කටයුතු කළ යුතු වේ. | අදහස් දක්වා නොතිබුණි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය අවසානයට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු එකතු කල අගය මත බදු (VAT) සඳහා මාසිකව හා කාර්තු පදනමට ගෙවීම් කිරීමේදී රු.1,002,778 ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. | වැඩිපුර ගෙවා තිබූ මුදල් ආපසු අයකර ගැනීමට හෝ හිලව් කිරීමට කටයුතු කළ යුතු වේ. | රු.1,002,778 ක වැඩිපුර ගෙවා ඇති එකතුකල අගය මත බදු මුදල දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මඟින් විමසා එම මුදල ඉදිරි වර්ෂ සඳහා හිලව් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව කාරුණිකව දන්වා සිටිමි. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**3.3.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාවේ ලේකම් තනතුර වසර ගණනාවක සිට පුරප්පාඩු වී ඇති අතර, වැඩ බැලීමට ද්විතියික ශ්‍රේණියේ සංවර්ධන නිලධාරියෙකු පත් කර තිබුණි. මුළු සේවක සංඛ්‍යාව තුල ද්විතියික අංශය තුල පුරප්පාඩු 46 ක් විය. | අදාල පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | ද්විතියික අංශයේ පුරප්පාඩුවලින් 36 ක් ගිනි නිවීමේ අංශ කාර්යය මණ්ඩලය වේ. බඳවා ගැනීම සඳහා ඉල්ලීම් කර ඇත. |

**3.4 ප්‍රසම්පාදනය**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කල යුතු වේ. | අතපසු වීමක් හේතුවෙන් 2018 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට නොහැකි වූ අතර 2019 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර ඇත. |

**3.5 නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2014 හා 2017 වර්ෂවලදී මිලදීගෙන ගබඩාවේ දිගුකාලීනව නිකුත් නොවී පවතින රු.301,845 | අදාල වත්කම් අවශ්‍යතාවය අනුව මිලදී ගත යුතු අතර | අයිතම 04 ක් දැනටමත් නිකුත් කර ඇති අතර, අයිතම 02 ක් පරිත්‍යාග වශයෙන් ලැබී ඇත. |

| | | |
|---|---|---|
| ක් වටිනා ස්ථාවර වත්කම් 08 ක් පැවති අතර එම වත්කම්වල වගකීම් කාලයද ඉකුත් වී තිබුණි. | කඩිනමින් අදාල කාර්යය සඳහා යෙදවීමට කටයුතු කළ යුතු වේ. | දැනට භාවිතා කරන ඒවා පසුව ගැනීමට ගබඩාවේම තබා ඇති අතර අවශ්‍යතාවය අනුව නිකුත් කිරීමට කටයුතු කරන බවත් දන්වා සිටිමි. |

**3.6 වාර්ෂික භාණ්ඩ/තොග සමීක්ෂණය**

---------------------------------------

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාලව සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණයේදී භාණ්ඩ වර්ග 31 ක ඌනතාවයක් පැවතුණ අතර සමීක්ෂණ වාර්තා අනුව ආයුර්වේද මධ්‍යස්ථානයට ලබාගෙන ඇති වත්කම් අයිතම 04 ක වටිනාකම් නොමැතිව ලේඛනගත කර තිබුණි. | ඌනතාවය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. | එම භාණ්ඩ සඳහා වගකිව යුතු නිලධාරීන්ගෙන් එහි වටිනාකම අය කර ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

------------------------------------------

**4.1 අයවැය පාලනය**

-------------------

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුල අයවැය විෂයයන් 75 ක ඇස්තමේන්තුගත වෙන්කිරීම් සියයට සියයක් ඉතිරිව තිබුණි. | නිවැරදිව ඇස්තමේන්තු සැකසිය යුතු වේ. | සමාලෝචිත වර්ෂය තුල වැඩ සටහන් 1 යටතේ අයවැය විෂයයන් 19 ක ඇස්තමේන්තුගත වෙන් කිරීම් ඉතිරිව ඇති බැවින් ඒ පිළිබඳව සොයා බලා හැකි ඉක්මණින් ඊට පිළිතුරු ඉදිරිපත් කරන බව කාරුණිකව දන්වමි. |

**4.2 අභ්‍යන්තර විගණනය**

------------------------

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>නිර්දේශය</u> | <u>ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම</u> |
|---|---|---|
| ආයතනය තුළ ප්‍රමාණවත් පරිදි අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ සිදුකළ අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ. | 2018 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව සිදු කර ඇති බවත් එහෙත් අභ්‍යන්තර විගණනයේ යම් යම් අතපසු වීම් ඇති බැවින් 2019 වර්ෂයේ දී හැකි පමණ අභ්‍යන්තර විගණනය සිදු කරන බව දැනුම් දෙමි. |